*සැ. යු.* - 2019.10.18 දින පළ වූ අංක 2,146 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,147 - 2019 ඔක්තෝබර් මස 25 වැනි සිකුරාදා - 2019.10.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 652 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ඔක්තෝබර් මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ඔක්තෝබර් මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 නොවැම්බර් මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 නොවැම්බර් මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී. අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, කොළඹ 01, සහ ගල්කිස්ස ගාලු පාරේ, අංක 234 ඒ දරන ස්ථානයේ ''ගල්කිස්ස ශාඛාව'' යනුවෙන් සඳහන් කරනු හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තේය.

*......................පැමිණිලිකරු.*

නඩු අංකය : H. C. Civil/300/15/MR
ස්වභාවය : උකස්
මුදල : රු. 5,712,074.69
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*- එදිරිව -*

1. කෙයාර් ෆාර්මා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 103, ගාලු පාර, දෙහිවල.
2. පුන්‍යානන්ද කනංකෙ සූරියආරච්චි ලියනගේ, අංක 199/22, පැෂන් ගාඩ්න්, කොතලාවල, කඩුවෙල.
3. කලන පබසර පූජිත කනංකෙ සූරියආරච්චි ලියනගේ අංක 199/22, පැෂන් ගාඩ්න්, කොතලාවල, කඩුවෙල
4. කනීල් තත්සර පූජිත කනංකෙ සූරියආරච්චි ලියනගේ අංක 199/22, පැෂන් ගාඩ්න්, කොතලාවල, කඩුවෙල.
5. කලිඳු පුන්සර පූජිත කනංකෙ සූරියආරච්චි ලියනගේ, අංක 199/22, පැෂන් ගාඩ්න්, කොතලාවල, කඩුවෙල

*.......................විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 02 වන දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාර විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර බැංකුවට අය විය යුතු රු. 4,166,500 ක මුදලක් සහ රු. 1,545,574.69 ක් ලෙස සමස්ථය රු. 5,712,074.69 ක මුදලක් සහ රු. 4,166,500 ක් වූ එකී මුදල මත 2014 ජුනි මස 12 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් හා අවසාන වශයෙන් බේරුම් කරනු ලබන තෙක් වර්ෂයකට 22% ක වැඩිදුර පොලියක් ද සහ නඩු ගාස්තුද අය කර ගැනීම සඳහා විත්තිකරුවන්ට විරුද්ධව ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුව ප්‍රකාර ක්‍රියා කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින්, එකී මුදල පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා (විත්තිකරුවන් විසින් සමථය අනුව ගෙවා ඇති මුදල අඩුකර) මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරී පත්‍රයේ බලය පිට විත්තිකරුවන්ට අයත් මෙහි පහත උපලේඛනයේ පළවන අයිතමය සහ දෙවන අයිතමය යටතේ සවිස්තරව දක්වා ඇති නඩුවට අදාල උකස් දේපල,

**වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින ප. ව. 2.00 ට**

එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපලට පිවිසීම.-* කඩුවෙල පාරේ පට්ටියවත්ත දක්වා ගොස් දකුණට හැරී පට්ටියවත්ත පාරේ මීටර් 100 ක් පමණ පැෂන් ගාඩ්න් නිවාස යෝජනා ක්‍රමය දෙසට ගමන් කර වමට හැරී එම නිවාස යෝජනා ක්‍රමයේ මීටර් 250 ක් පමණ ගිය විට අදාල දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් දේපල මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500 සඳහා රු. 150 ක ගාස්තුවක් ද රු. 7,500 ඉක්ම වන සෑම රු. 1,000 ක් සඳහාම රු. 5 බැගින් පිස්කල් ගාස්තු හා විකුණුම් සඳහා වන සියළුම වියදම් ගෙවිය යුතුය.

**උපලේඛනය**

*1 වන අයිතමය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කොතලාවල පිහිටා ඇත්තා වූ ද, උතුරින් එම පිඹුරේ අංක 23 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : (අඩි 20 ක් පළල ඇති පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම මත) අංක 25 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 21 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : අංක 13 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 2396A හා 1993 අප්‍රේල් මස 26 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහකින් (අ.0, රූ. 0, පර්. 12) යුක්තවූද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B177/86 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2396A දරන පිඹුරේ නිරූපිත අංක 22 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

*2 වන අයිතමය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කොතලාවල පිහිටා ඇත්තාවූ ද, උතුරින් අංක 24 බිම් කැබැල්ලෙන්, අංක 25 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් (අඩි 20 ක් පළල ඇති පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම මත) අංක 25 බිම් කැබැල්ලෙන්, දකුණින් අංක 22 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් අංක 13 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 2396A හා 1993 අප්‍රේල් මස 26 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහකින් (අ. 0, රූ. 0, පර්. 12) යුක්තවූද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B170/26 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2396A දරන පිඹුරේ නිරූපිත අංක 23 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද මුලු ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පස හා වෙනත් සියලු දේ සමග වේ.

ඒ ඉඩම් කැබැල්ලට පහත සඳහන් පාරක් සඳහා වෙන් කරන ලද බිම් කැබැලි මතු පිටින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

1. ඉහත කී කොතලාවල පිහිටා ඇත්තා වූ ද, උතුරින් : මෙම ඉඩමේම ඉතිරි කොටසින්, නැගෙනහිරින් : අංක 4 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 1 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : ධර්මසේන බස්නායකගේ උරුමක්කාරයන් විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන් මායිම්වූ ද, බලයලත් මිනින්දෝරු සිරි. ඩී. ලියනසූරිය විසින් සාදන ලද අංක 3179 හා 1987 ජූනි මස 17 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සකින් (අ. 0, රූ, 0, පර්. 20) යුක්තවූ ද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 947/207 වෙලුමේ පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 3179 දරන පිඹුරේ නිරූපිත අංක 3 බිම් කැබැල්ල (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

2. ඉහත කී කොතලාවල පිහිටා ඇත්තා වූ ද, උතුරින් : A බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් : A බිම් කැබැල්ලෙන්, හා ද ලැනරෝල්ට හා වෙනත් තැනැත්තන්ට අයත් උඩුමුල්ලේ ඉතිරි කොටසින්, දකුණින් : අංක 3179 දරන පිඹුරේ අංක 3 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් : ධර්මසේන සේනානායකගේ උරුමක්කාරයන්ට අයත් ඉඩමෙන් මායිම්වූද, බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් සාදන ලද අංක 3358 හා 1985 ජනවාරි මස 14 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහහතයි දශම පහකින් (අ. 0, රූ. 0, පර්. 17.5) යුක්තවූ ද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G943/205 වෙළුමේ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 3358 දරන පිඹුරේ නිරූපිත අංක 5 බිම් කැබැල්ල (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

3. ඉහත කී කොතලාවල පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 1, 2, 3, 4, 5, 8, 9, 12, 16 සහ 17 දරන බිම් කැබලි වලින්, නැගෙනහිරින් අංක 18 සහ අංක 34 බිම් කැබලි වලින්, දකුණින් අංක 39, 40, 41, 42, 43, 44, 45,46 සහ 48 බිම් කැබලි වලින් සහ බස්නාහිරින් පාරින් මායිම් වූද, බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 2396 ඒ හා 1993 අප්‍රේල් මස 26 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම පහයි බින්දුවකින් (අ. 0, රූ. 1, පර්. 4.50) යුක්ත වූ ද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G943/206 වෙලුමේ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2396A දරන පිඹුරේ නිරූපිත අංක 47 දරන බිම් කැබැල්ල (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කරන ලද නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

4. ඉහත කී කොතලාවල පිහිටා ඇත්තා වූ ද, උතුරින් : අංක 18, 19, 25, 31 හා 32 දරන බිම් කැබැලි වලින් නැගෙනහිරින් අංක 33 බිම් කැබැල්ලෙන්, දකුණින් : අංක 35, 36, 37, 38, 39 හා 33 ඒ බිම් කැබැලි වලින් සහ බස්නාහිරින් අංක 47 බිම් කැබැල්ලෙන් මායිම්වූද, බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 2396 හා ඒ හා 1993 අප්‍රේල් මස 26 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහයි බින්දුවකින් (අ. 0, රූ. 0, පර්. 12.50) යුක්තවූද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 943/207 වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, උඩුමුල්ල යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් ඉහත කී අංක 2396 ඒ දරන පිඹුරේ නිරූපිත අංක 34 බිම් කැබැල්ල (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

5. ඉහත කී කොතලාවල පිහිටා ඇත්තාවූ ද, උතුරින් ‡ අංක 24 බිම් කැබැල්ලෙන්, නැගෙනහිරින් අංක 26, 27, 28, 29, 30 හා 31 දරන බිම් කැබැලි වලින්, දකුණින් ‡ අංක 34 බිම් කැබැල්ලෙන් සහ බස්නාහිරින් ‡ අංක 19, 20, 21, 22, 23 සහ 24 දරන බිම් කැබලි වලින් මායිම් වූ ද, බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 2396 ඒ හා 1993 අප්‍රේල් මස 26 වන දින දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විස්සකින් (අ. 0, රූ. 0, පර්. 20) යුක්තවූද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී.967/79 වෙලුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, ඉහත කී අංක 2396 ඒ දරන පිඹුරේ නිරූපිත අංක 25 බිම් කැබැල්ල (පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම) වශයෙන් සලකුණු කරන ලද බෙදා වෙන් කරන ලද නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

බී. ජේ. එෆ්. ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය - කොළඹ.

2019 ඔක්තෝබර් 17 වැනි දින දී ය.

10-1035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.